(c) www.sinhalalyrics.com

උපාසකම්මා ඉපදුනු හීන කුලේ
මහණ කරන්නයි යන්නේ ඇගේ කොලු
ඌට නිකායක් වෙන් කර තබා තිබේ
අප මුණි බණේ ඒකද හාමුදුරුවනේ

පිරිත් නුල් බඳිමින් ජන හතුරන්ට
යතුරු කැරැලි අඳනය යට ගසාගෙන
අපවත් වෙන්ට පෙර සහලේ ඥාතිවරු
මහණ කරන එකදැයි මුණි බණේ අනේ

කුණු හොඳන්න මහතැන් වල අපේ රටේ
පන්සල තමුන්නැහිගේ හොඳ වෙල්ලාව
ටිකට් විකුණලා පෙරහැර කරන කොට
කරඬුවෙ ඉඳිවිද ධාතුන් වහන්සෙලා

රට දැය සමය රැක ගත්තෙත් චීවරයයි
රට දැය සමය සුරකින්නෙත් චීවරයයි
එවන් සසුන සමහර හිමිවරු නසති
කුලගොත් ඥාති සංග්‍රහ නිල තල සොයමින්

කුඩාපොල වගේ විරු හාමුදුරුවරු
අදත් අප අතර හිඳ මේ ලෙස කියති
රට කන උන්ව වනසා රට දැය රැකුම
තමයි අපේ අද දවසේ මහණකම

පද රචනය - සුනිල් ආරියරත්න
සංගීතය - ඔස්වින් මුණසිංහ

(c) www.sinhalalyrics.com